සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 8 - ශ්‍රේණිය

## නර්තනය (දේශීය)

නම/විභාග අංකය :- ........................................................................ කාලය: පැය 02යි.

## I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 10දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) තමාතා අභ්‍යාසවල නිරතවීමෙන් ඇතිවන ප්‍රයෝජනයක් නොවන්නේ,
(1) ශරීරය නිරෝගීවීම (2) සමබරතාවය ඇතිවීම
(3) පැතැපත් බව (3) ස්ථූලතාවය නැතිවීම

(02) උඩරට, පහතරට නර්තනයේ දී හස්ත, පාද චලන, අංගහාර හුරු කර ගැනීම සඳහා නටනු ලබන සරඹ වන්නේ,
(1) පා සරඹ, මණ්ඩිපද (2) ගොඩසරඹ, ඉලංගම් සරඹ
(3) දොඹින පද, ගොඩ සරඹ (4) ඉලංගම් සරඹ, මණ්ඩි පද

(03) ∧ හා / යන සංකේත යොදාගනු ලබන්නේ,
(1) ප්‍රස්ථාරකරණයේ දී (2) තමාතා අභ්‍යාසවල දී
(3) ගොඩසරඹ නැටීමේ දී (4) පා සරඹ නැටීමේ දී

(04) සත්ව චරිතයක් නර්තන නිර්මාණයෙන් ඉදිරිපත් කිරීමේ දී වඩාත් සුදුසු සත්වයා වන්නේ,
(1) දිවියා (2) කුඹියා (3) මොනරා (4) කපුටා

(05) කවි ගායනා, සරල අංගහාර භාවිත කරමින්, සාමූහිකව නටන නැටුමකි,
(1) නාට්‍ය (2) ගැමි නැටුම් (3) වන්නම් (4) වට්ටම්

(06) සුරියකුල ඇති හිරු දෙවියන්නේ...... යන කවිය ගායනා කළ හැකි තිත් රූපය වන්නේ,
(1) $\acute{1}\,2\,3\,4 / \acute{1}\,2\,3\,4$ (2) $\acute{1}\,2\,3 / \acute{1}\,2\,3$ (3) $\hat{1}\,2 / \acute{1}\,2\,3$ (4) $\hat{1}\,2\,3 / \acute{1}\,2\,3\,4$

(07) $\hat{1}\,2 / \acute{1}\,2\,3\,4$ යන තිත් රූපය හඳුන්වන්නේ,
(1) මැදුම් තනි තිත (2) මැදුම් මහ දෙතිත (3) සුළු මැදුම් දෙතිත (4) සුළු මහදෙතිත

(08) ශරීරයේ විවිධ අංගවල ඇති දොස් දුරු කිරීම සඳහා ශාන්ති කර්මවල දී .................................... ගායනා කරනු ලබයි.
(1) පාග ගී (2) කඩතුරා කවි (3) මල් පහන් කවි (4) සිරසපාද කවි

(09) බෙර ඇස සඳහා හරක් බොක්ක හෙවත් බොකු සිවිය භාවිත කරමින් .............................................. නිර්මාණය කරයි.
(1) පහතරට බෙරය (2) උඩැක්කිය (3) දවුල (4) ගැට බෙරය

(10) ශාන්ති කර්ම පැරසිලි සඳහා ........................................ සම්ප්‍රදායිකව භාවිත වේ.

(1) චීමයි කොළ, පාට පැන්සල් (2) ලී , රෙජිෆෝම්

(3) තීන්ත හා පතුරු (4) කෙසෙල් බඩ, ගොක්කොළ

• අංක 11 - 15 දක්වා ගැළපෙන පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

(11) පේරමන් රජුගේ හිසරදාව සුවපත් කිරීම සඳහා ........................................ ශාන්ති කර්මය සිදුකරන ලදී.

(12) ජේ. එජ්. ප්‍රනාන්දු මහතා ........................................ නර්තන සම්ප්‍රදායට විශාල සේවයක් කළ ආචාර්යවරයෙකි.

(13) නවරාත්‍රී උත්සවය පුරා දින ........................................ පැවැත්වීම හින්දු භක්තිකයන්ගේ චාරිත්‍රයකි.

(14) රත්නද්වීප ජන්ම භූමි - ලංකාද්වීප විජය භූමි.... යන ගීතය ගයනු ලබන්නේ ........................................ විසිනි.

(15) උඩරට නර්තන සම්ප්‍රදායට අදාළ නර්තන අංග දක්නට ලැබෙන අක්කර්ෂවත් අන්දමින් පවත්වනු ලබන ........................................ ඇසළ මාසයේ දි පැවැත්වේ.

• 16 - 20 දක්වා ප්‍රශ්නවලට හරි නම් ✓ ලකුණ ද වැරදි නම් × වැරදි ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

(16) ගොප්ගෙඩිය ශාන්ති කර්ම පැරසිලි සඳහා පමණක් නොව වෙනත් පැරසිලි සඳහා ද යොදාගනී. ( )

(17) කලා ක්ෂේත්‍රම් භරත නාට්‍යම් උගන්වන ආයතනයකි. ( )

(18) "තත්, දිත්, තොං, තං ගැටබෙර වාදනයේ මූලික අක්ෂර වේ. ( )

(19) ශාන්ති කර්මයක් ගමක පැවැත්වීම මඟින් සාමූහිකත්වය හා අන්‍යෝන්‍ය සම්බන්ධතාවය වැඩි දියුණු වේ. ( )

(20) ඔබ පාර මාරුවීමේ දී වේගයෙන් පැමිණි වාහනයක් එක්වර තිරිංග තද කර නතර කිරීම නිසා ඔබට සිතා පහළ විය හැකි ය. ( )

(ලකුණු 20 x 2 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකක් ඇතුළුව ප්‍රශ්න තුනක් ලියන්න.

(01) ඔබ උගත් ශාන්ති කර්මයක් අදාළ කර ගනිමින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ශාන්ති කර්මය නම් කර අදාළ සම්ප්‍රදාය ලියන්න. (ලකුණු 04)

(ii) එදා පැවැත්වීමේ හේතුව හා අද පැවැත්වීමේ හේතු තුනක් දක්වන්න. (ලකුණු 04)

(iii) පුද ලබන දෙවිවරු දෙදෙනෙක් ලියා දක්වන්න. (ලකුණු 02)

(iv) චාරිත්‍ර විධි දෙකක් ලියන්න. (ලකුණු 02)

(v) නර්තන අංග දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(vi) වාදන අංග දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(vii) රංග වස්ත්‍රාභරණ කට්ටලය නම් කරන්න. (ලකුණු 02)

(viii) පැරසිලි අංග දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(ලකුණු 20)

(02) (i) සුළු මැදුම් දෙතිතට (12 / 1 23) අයත් බෙර පදයක් ප්‍රස්තාර ගත කරන්න. (ලකුණු 06)

(ii) මල් ගවපාලා කොණ්ඩය බැඳලා - ඉන තද ර පළ පැලද ගෙනේ
පියපුරු නිමලා එන ලැම උදුලා - පළ පටකින් වසමින් යසිනේ
යන පවරම් කවිය මහ තනි තිතට ප්‍රස්තාර ගත කරන්න. (ලකුණු 06)

(iii) මැදුම් තනි තිතට අයත් ඔබ උගත් වන්නමක / පින්දු වන්නමක / කප්තිරම / කලාසම /
ඉරට්ටිය ප්‍රස්තාර කරන්න. (ලකුණු 08)

(03) භරත නාට්‍යම් ඉන්දියාවේ දක්ෂිණ ප්‍රදේශයේ ප්‍රචලිතව ඇති නර්තන සම්ප්‍රදායකි.

(i) ප්‍රචලිත ප්‍රදේශ දෙකක් දක්වන්න. (ලකුණු 04)

(ii) භරත නාට්‍යම් හි උපත පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) සංගීත සම්ප්‍රදාය නම් කොට සංගීතය භාවිත වන අයුරු විස්තර කරන්න. (ලකුණු 08)

(04) (i) පහතරට නර්තන සම්ප්‍රදායට අයත් යක් බෙරය සෑදීමට ගන්නා අමුද්‍රව්‍ය දෙකක් ලියන්න. (ලකුණු 04)

(ii) පහතරට බෙරයේ බෙර ඇස, දිග ප්‍රමාණයන් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) යක් බෙරයේ රූප සටහනක් ඇඳ එහි කොටස් හයක් ලකුණු කරන්න. (ලකුණු 12)

(05) රූකම් නර්තන කලාව හා සම්බන්ධ තොරතුරු ගවේෂණයේ දී රූකම් කදිම මූලාශ්‍රයකි.

(i) නර්තන රූකම් සහිත ලී කැටයම් දක්නට ඇති ස්ථානයක් නම් කරන්න. (ලකුණු 04)

(ii) භරත නැටුම් විලාස දක්වෙන රූකම් දකිය හැකි ස්ථානයක් නම් කර කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 08)

(iii) මෙම රූකම් නැරඹීම හා අධ්‍යයනය මගින් අපට ලබාගත හැකි ප්‍රයෝජන හතරක් ලියන්න. (ලකුණු 08)

(06) පහත සඳහන් මාතෘකා දෙකක් තෝරාගෙන ඒ පිළිබඳව වාක්‍ය හතරකට නොඅඩු විස්තරයක් කරන්න.

(1) සිරස පාද කවි
(2) මහනුවර දළදා පෙරහැර
(3) සතර බීජාක්ෂර
(4) සවරං නැටුම
(5) තාම්පතා අභ්‍යාස

(ලකුණු 10×2 = 20)